**5. ගාථාව**

**"පුප්ඵානි හෙව පචිනන්තං - බ්‍යාසත්තමනසං නරං
අතිත්තං යෙව කාමේසු - අන්තකො කුරුතේ වසං"ති.**

**පදාර්ථය**

| | |
|---|---|
| **පුප්ඵානි** | - මල් |
| **පචිනන්තං ඉව** | - කඩා රැස්කරන්නෙකු මෙන් |
| **ඉහ** | - මේ ලෝකයෙහි |
| **බ්‍යාසත්තමනසං** | - පඤ්චකාමගුණයෙහි ඇලුණු සිත් ඇති |
| **නරං** | - මනුෂ්‍යයා |
| **කාමේසු** | - වස්තුකාම-ක්ලේශකාමයන්හි |
| **අතිත්තං එව** | - සෙවීමෙන්, ලැබීමෙන්, පරිභෝග කිරීමෙන්, තැන්පත් කිරීමෙන් සෑහීමකට නො පැමිණියේ ම |
| **අන්තකො** | - මාර තෙම |
| **වසං කුරුතේ** | - වසඟ කරන්නේ ය. |

**භාවාර්ථය**

මල් රැස් කරන විසිරුණු සිත් ඇති මිනිසා මෙන් වස්තුකාම, ක්ලේශකාමයන්හි අතෘප්ත පුද්ගලයා ව මරුවා සිය වසඟයට ඇදගනී.

**නිදාන කථාව**

තව්තිසා දෙව්ලොව මාලභාරී නම් දිව්‍යපුත්‍රයෙක් විය. ඔහු දවසක දෙවඟනන් පිරිවරා මල් උයනට ගියේ ය. ඉන් පන්සියයක් දෙවඟනෝ ගස් නැඟී මල් නෙළා බිම හෙළති. එපමණක් ම දෙවඟනෝ ඒ මල් ගෙන දිව්‍යපුත්‍රයාට පළඳවති. ඒ අය අතර සිටි එක් දෙව්දුවක් එව්ලෙහි ගස උඩ දී ම කලුරිය කළා ය.

දෙව්ලොවින් චුත වුණු ඕ තොමෝ සැවැත් නුවර කුලගෙයක උපන්නා ය. ඇයට පෙර ජාති සිහි කිරීමට හැකි නුවණ පහළ විය.

එයින් ඕ තොමෝ පෙර අත්බවෙහි මාලභාරී දිව්‍යපුත්‍රයාගේ බිරිඳක ව විසූ බව දැන නැවතත් ඔහු වෙත ම උපදින්නට පතා නන්වැදෑරුම් පින්දහම් කළා ය.

ඕ තොමෝ සොළොස් හැවිරිදි කල්හි තෙරුවන් සරණ ගොස් බොහෝ පින්දහම් කොට ඒ දෙව්පුත් ළඟම ඉපදීමට පැතී ය. භික්ෂූන් වහන්සේලා ඈ කියන බස් අසා "මෝ තොමෝ නිතර හිමියා පතා ය" යි ඇයට 'පතිපූජිකා' යි නම් කළාහු ය.

පතිපූජිකාව නිතර මහාසඞ්ඝයා වහන්සේට උපස්ථාන කරන්නී දානශාලාව අතු ගා පිරිසිදු කරයි. අසුන් පනවා තබයි. පැන් පෙරා තබයි. දන් පිළියෙළ කරයි.

මෙසේ පින්දහම්හි යෙදී සිටින ඇය පිළිවෙළින් පුතුන් සතරදෙනෙක් ලැබුවා ය. දිනක් දන් දී, පුද පවත්වා බණ අසා, සිල් රැක සවස් ව ගෙදර ගිය කල්හි හදිසියේ හටගත් රෝගයකින් ඇය කලුරිය කොට පෙර අත්බවයෙහි තම හිමියා ව විසූ මාලභාරී දෙව්පුත් වෙත ම උපන්නා ය. එහි අනෙක් දෙවඟනෝ දෙව්පුත්හට ඒ තාක් ම මල් පළඳවන්නෝ ය. මිනිස්ලොව අවුරුදු සියයක් තව්තිසාවැසි දෙවියනට එක් දවසෙකි. එහෙයින් දෙව්පුත් තෙමේ දෙවඟන චුත වූ බැව් නො දන්නේ උදෑසන පටන් මෙතෙක් වේලා කොහි ගියා දැ'යි විචාළේ ය. ඕ තොමෝ සිදු වූ සියල්ල කීවා ය.

දෙව්පුත් තෙමේ "මිනිසකුගේ පරමායුෂ කෙතරම් දැ"යි ඇසුවේ ය. "ඉතා ම මඳ ය. වැඩි ම ගණන අවුරුදු සියයක් පමණ වේ" යයි කීවා ය. "ඒතරම් අඩු දිවිපැවතුම් ඇති මිනිස්සු නින්දෙන්, කෙළිසෙල්ලමෙන් කල-දවස යවත් ද? නැති නම් දන්-පින් කෙරෙත් ද" යි ඇසී ය. "අසංඛ්‍යයක් ආයු ගෙන උපන්නවුන් සේ, ජරා-මරණ නැත්තවුන් සේ, මිනිසුන් වරදෙහි බැඳී අපරාධ කෙරෙමින් පස්පව් සිදු කරමින් ලැජ්ජා, භය දෙකින් තොර ව තිරිසනුන් සේ දිවි යවති" යි දෙව්දුව කීවාය.

එවිට දෙව්පුත් තෙමේ "සොඳුර, තව්තිසාවැසි අපගේ ආයුෂ මිනිස් ගණනින් තුන්කෝටි හැටලක්ෂයෙකි. මඳ ආයුෂ ඇති මනුෂ්‍යලෝකයෙහි මිනිසුන් දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම ආදි පින්කම් කිරීමෙහි පමා වීම තමනට කර ගන්නා ලොකු නපුරෙකි" යි කීවේ ය.

පතිපූජිකාවගේ මරණය ගැන කම්පාවට පත් භික්ෂූහු එය බුදුරජාණන් වහන්සේට සැළ කළහ. එවිට බුදුරජාණන් වහන්සේ "ඇය පැතූ ලෙසට ම හිමියා වෙත උපන්නීය" යි වදාළ විට, "ස්වාමීනි, ඈ එහි නැතැ" යි භික්ෂූහු කීහ. "ඒ හිමියා පතා ඇය පින් කළා නො වේ. පෙර ජාතියෙහි දී ඇයට හිමි වූයේ තව්තිසාවැසි මාලභාරී දිව්‍යපුත්‍රයා ය. ඔහු සමීපයෙහි ම උපන්නීය" යි වදාළ සේක.

"සත්ත්වයන්ගේ ජීවිතය කෙතරම් අල්ප ද? උදය වේලෙහි ඕ තොමෝ අප වැළඳෙව්වා ය. සවස් වේලෙහි මළා ය" යි භික්ෂූන් කථා කරන්නට වූ කල්හි ඒ අසා බුදුරජාණන් වහන්සේ "සත්ත්වයන්ගේ ජීවිතය ඉතා අල්ප ය. මාර තෙමේ වස්තුකාම, ක්ලේශකාමයන්ගෙන් සෑහීමකට පත් නො වූ මේ සත්ත්වයන් තමා යටතට ගෙන හඬව හඬවා, විලාප කියව කියවා ඇද ගෙන යයි" යනුවෙන් වදරා "**පුප්ඵානි හෙව පචින්නතං**" යන ගාථාව වදාළ සේක. දේශනාවගේ අවසානයෙහි බොහෝදෙනා සෝවාන්ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය - නැණවතා මුදලින් නො ලැබිය හැකි දිව්‍යසම්පත් නුවණින් ලබන්නේ ය.**

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(පොසොන් 2552)**

__සම්පාදක:__ පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

__පරිගණක සැකසුම:__ පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

__ධර්මදානය:__ පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිසත් තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**